


# අලියාන්ස්
# පවර්ලින්ක් සින්ගල්

## ඔබගේ ආයෝජනයන් වර්ධනය කරගන්නා අතරතුර ඔබගේ ආරක්ෂාව ද සලසා ගන්න

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පැවැත්වෙන, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි පූර්ණ හිමිකාරීත්වය දරන උප සමාගම වේ.

150,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 126කට පමණ සේවය සලසයි. 2021 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස පිදුම්ලත් අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් පවර්ලින්ක් සින්ගල් (POWERLINK SINGLE)

අප ආයෝජනය කරන මුදලට උපරිම ප්‍රතිලාභයක් ලබාදෙන ආයෝජන සැපයුමක් තෝරාගැනීම අප මුහුණදෙන පොදු ගැටළුවකි.

ජාත්‍යන්තර ආයෝජන විශේෂඥයා වන අලියාන්ස් ආයතනයේ විශේෂඥ අත්දැකීම් සම්භාරයෙන් බලගැන්වූ අලියාන්ස් පවර්ලින්ක් සිංගල් ඔබේ මුදල් ඔබට අවැසි ලෙස ආයෝජනය කිරීමේ හැකියාව සලසන සුවිශේෂී ජීවිත රක්ෂණ සැලසුමකි.

ඔබගේ ජීවිතයේ ප්‍රමුඛතාවයන් හොඳින් හඳුනාගත් මෙම සැලසුම, පහසුවෙන් ලබා ගත හැකි ජීවිත රක්ෂණ සැලැස්මක් මෙන්ම කදිම ආයෝජන විකල්පයකි. අලියාන්ස් පවර්ලින්ක් සිංගල් ඔබේ ආයෝජනයට, කාලයත් සමග තිරසාර වර්ධනයක් ලබා දෙමින්, ඔබත්, ඔබේ ආයෝජනයත් රැකගන්නා බැවින් සිතේ සැනසුමින් පිරි, පූර්ණ දිවියක සැනසුම ළඟා කර ගැනීමට ඔබට ඉඩ සලසයි.

අවදානම් දැරීමට ඇති ඔබේ කැමැත්ත අනුව, ඔබට සුදුසුම ආයෝජන ක්‍රමවේදය (බොන්ඩ් අරමුදල, ග්‍රෝවිත් අරමුදල, බැලන්ස්ඩ් අරමුදල සහ ෂරියා අරමුදල) තෝරාගැනීමේ නම්‍යතාවය අලියාන්ස් පවර්ලින්ක් සිංගල් ලබා දෙයි.

## තෝරා ගත හැකි ආයෝජන අරමුදල් විකල්ප

ආයෝජනය සඳහා තෝරාගැනීමට පවර්ලින්ක් - සින්ගල් ඔබට අරමුදල් 4ක් ලබා දෙයි. ඒවා පිළිබඳ වැඩි විස්තර පහත දැක්වෙයි.

| | |
|---|---|
| අලියාන්ස් ග්‍රෝවිත් අරමුදල | මෙමගින් 95%ක උපරිමයක් දක්වා ශ්‍රී ලංකා කොටස් වෙළඳපොල තුළ ආයෝජනය කෙරේ. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්යසාධනය ශ්‍රී ලංකා කොටස් වෙළඳපොල ක්‍රියාකාරීත්වය මත රඳා පවතියි. මෙය අවදානම් දැරීමට කැමති අය සඳහා සැකසූ ආයෝජන ක්‍රමවේදයකි. |

| | |
|---|---|
| අලියාන්ස් බොන්ඩ් අරමුදල | මෙමගින් 80%ක උපරිමයක් දක්වා. රජයේ බැඳුම්කර, ආයතනික බැඳුම්කර සහ ස්ථාවර තැම්පතු වැනි ශ්‍රී ලාංකික ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් තුළ ආයෝජනය කරයි. මෙම අරමුදල කොටස් වෙළඳපල තුළ කිසිදු ආයෝජනයක් සිදු නොකරයි. මෙය සම්ප්‍රදායික ආයෝජන ක්‍රම තුළ පමණක් ආයෝජන සිදුකිරීමට කැමති අය සඳහා සැකසූ ආයෝජන ක්‍රමවේදයකි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්යසාධනය එහි ආයෝජනයන්හි (එනම් ශ්‍රී ලාංකික ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම්) ක්‍රියාකාරිත්වය මත රඳා පවතියි. |
| අලියාන්ස් බැලන්ස්ඩ් අරමුදල | ශ්‍රී ලාංකික ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් තුළ සහ ශ්‍රී ලංකා කොටස් වෙළඳපල තුළ යන දෙකෙහිම 60%ක උපරිමයක් දක්වා මෙමගින් ආයෝජනය කරයි. එබැවින් මෙම අරමුදල සමතුලිත ආයෝජන ක්‍රම වේදයක් ලෙස හැඳින්විය හැකියි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්යසාධනය ශ්‍රී ලාංකික ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් සහ ශ්‍රී ලංකා කොටස් වෙළඳපල යන බාණ්ඩ දෙකෙහිම ක්‍රියාකාරිත්වය මත රඳා පවතියි. |
| අලියාන්ස් ෂරියා අරමුදල | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) මගින් නියාමනය කරනු ලබන අරමුදල් කළමනාකරණ ආයතනයක් විසින් කළමනාකරණය කරනු ලබන ෂරියා අවශ්‍යතා හා සමග 100% අනුකූලගතවූ මූල්‍ය වෙළඳපල අරමුදලක් වන හෙයින් අඩු අවදානමක් සහිත තිරසාර වර්ධනයක් බලාපොරොත්තු වන ආයෝජකයකු හට මෙය ඔබින අරමුදලකි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්යසාධනය ශ්‍රී ලාංකික මූල්‍ය වෙළඳපලෙහි ක්‍රියාකාරිත්වය මත රඳා පවතියි. |

## සැලසුමෙන් හිමිවන ප්‍රතිලාභ

### මරණයකදී

- රක්ෂණ කාල සීමාව තුළ - රක්ෂිත මුදල සහ ආයෝජන අරමුදල්හි ඒකක සියල්ලේ වටිනාකම
- රක්ෂණ කාල සීමාව අවසන් වූ පසු - ආයෝජන අරමුදල්හි ඒකක සියල්ලේ වටිනාකම

### රක්ෂණ කාල සීමාව තුළ

- අමතර ප්‍රතිලාභ

| | | |
|---|---|---|
| ඇතුලත්වීමේ වයස | අවම: වයස 18 | උපරිම: වයස 65 |
| රක්ෂණය කල් ඉකුත් වන වයස | - | උපරිම: වයස 75 |
| රක්ෂණ කාල සීමාව | අවම: වසර 5ක් | උපරිම: වසර 57ක් |
| වාරිකය | අවම: රු 50,000 (තනි වාරිකයක්) | උපරිම: සීමාවක් නොමැත |
| අමතර වාරික | අවම: රු 50,000 | උපරිම: තනි වාරිකයට සාමාන |
| ජීවිත ප්‍රතිලාභය | අවම: රු 50,000 | උපරිම: තනි වාරිකයට සාමාන |
| අතිරේක ප්‍රතිලාභ | - පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා<br>- අර්ධ සදාකාලික අකර්මණ්‍යතා<br>- හදිසි අනතුරක් හේතුවෙන් වන ජීවිත අහිමිවීම් | |

## අනෙකුත් ගුණාංග

### 1. අරමුදල් ස්විච් කිරීමේ හැකියාව

ඔබේ ආයෝජනයට සලසා ඇති ආයෝජන අරමුදල් අතර ඔබේ මුදල් හුවමාරු කිරීමට මෙමගින් ඉඩ ප්‍රස්තාව සැලසේ. රක්ෂණ වසරක් තුළ දෙවතාවක් මෙසේ නොමිලේ ස්විච් කිරීමට ඔබට හැකි වනු ඇති අතර ඉන් පසු සෑම ස්විච් කිරීමකට සුළු ගාස්තුවක් අය කෙරෙනු ඇත.

### 2. (Top UP) අමතර වාරික සමගින් අමතර ආයෝජන අවස්ථා

ඔබේ නිත්‍ය වාරිකයන්ට අමතරව, ඔබට හැකි විට ඔබේ ආයෝජන අරමුදල ඉහළ නැංවීමට අමතර වාරික ආයෝජනය කළ හැක.

**Allianz**

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493
අංක - 675, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,
(බේස්ලයින් පාර) කොළඹ 09, ශ්‍රී ලංකාව
දුරකතන :+9411 2 317 988 / 9
වෙබ් අඩවිය : www.allianz.lk
විද්‍යුත් තැපැල : customerservicelife@allianz.lk

**සැලකිය යුතුයි**

මෙහි එන ප්‍රතිලාභ සහ ආවරණයන්, පවර්ලින්ක් සින්ගල් ඔප්පුව සම්බන්ධයෙන් වන සංක්ෂිප්තයක් පමණක් වන අතර සියළුම නියමයන්, කොන්දේසි සහ බැහැර කිරීම් අලියාන්ස් පවර්ලින්ක් සින්ගල් ඔප්පුව ප්‍රකාර වේ.